# කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය (බස්නාහිර පළාත)

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)

## සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය - කොටදෙණියාව

# කිරිගව පාලන සහායක සහ පශු සම්පත් තාක්ෂණ ශිල්පී (NVQ4) පුහුණු පාඨමාලාව සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2025

කොටදෙණියාව, සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය, බස්නාහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන සත්ත්ව පාලනය හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර සඳහා පුහුණු හා ව්‍යාප්ති කටයුතු සිදු කරන පළාත් රාජ්‍ය ආයතනයකි. මෙම ආයතනය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ජාතික වෘත්තීය කුසලතා 04 වන මට්ටම සඳහා ප්‍රතීතනය ලබා සිටී. මෙම ආයතනය විසින් පවත්වනු ලබන එක් අවුරුදු පූර්ණ කාලීන, කිරිගව පාලන සහායක සහ පශු සම්පත් තාක්ෂණ ශිල්පී පුහුණු පාඨමාලා සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික, අවිවාහක අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ආධුනිකයින් බඳවා ගැනීම.**

■ **අවම සුදුසුකම්**

i. අයදුම්කරු අ.පො. ස. (සා.පෙළ) විභාගය අවම සම්මාන 02 කින් සිංහල, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සහිතව විෂයන් 06 කින් එකවර සමත් වී තිබිය යුතුය.

ii. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 18 ට වැඩි හා අවුරුදු 35ට අඩු යහපත් මානසික හා කායික සෞඛ්‍යයෙන් හෙබි අයෙකු විය යුතුය.

**02. පුහුණුව සඳහා බඳවා ගන්නා ක්‍රමවේදය**

i. පුහුණු පාඨමාලා දෙකෙන් වැඩි දෙනෙකු අයදුම් කරන පුහුණු පාඨමාලාව පළමුව ආරම්භ කරන අතර, අනෙක් පුහුණු පාඨමාලාව පසු කාලීනව ආරම්භ කෙරේ.

ii. පුහුණු පාඨමාලාවන් සඳහා නේවාසික සිසුන් 20 ක් හා අනේවාසික සිසුන් 20 ක් බඳවා ගැනේ.

අයදුම්කරුවන් සංඛ්‍යාව පාඨමාලාවට ඇතුළත් කර ගත හැකි සංඛ්‍යාව ඉක්මවා ඇති අවස්ථාවක අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතුය.

iii. සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පාඨමාලාවන් සඳහා බඳවා ගනු ලැබේ.

**03. අයදුම්පත් ඉදිරිපත් කිරීම් විස්තර**

i. බස්නාහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙබ් අඩවියට පිවිසීමෙන් අදාළ අයදුම්පත බාගත කළ හැකිය.(www.daph.wp.gov.lk)

ii. අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත), වැලිසර, රාගම යන ලිපිනය වෙත යොමු කළ යුතුය.

iii. මෙම බඳවා ගැනීමට අදාළ වෙනත් තොරතුරු 0332272214 යන දුරකථන අංකයට ඇමතීමෙන් ලබාගත හැකිය.

iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025 සැප්තැම්බර් 30 වන දින වේ.

**04. විශේෂ කොන්දේසි**

i. පුහුණු පාඨමාලාව සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ඇත.

ii. මෙම පුහුණු පාඨමාලා වල අධ්‍යයන කටයුතු සඳහා යන සියලු වියදම්, බස්නාහිර පළාත් සභාව මගින් දරනු ලබන අතර, නේවාසික පහසුකම්ද පුහුණු ආයතනය මගින් සපයනු ඇත. එහෙත් පුහුණු කාලය තුළදී ආහාරපාන, භෞතික හා අනෙකුත් පෞද්ගලික වියදම් අභ්‍යාසලාභීන් විසින් දැරිය යුතු වේ.

iii. තෝරා ගනු ලබන අභ්‍යාසලාභීන් අභ්‍යාස ආයතනයේ විනය හා ආචාර ධර්ම වලට යටත්ව පුහුණුව අවසන් කරන බවට මෙන්ම, පුහුණු කාලසීමාව සාර්ථකව අවසන් කරන බවට බැඳෙන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

iv. පුහුණු කාලය අවසන් කිරීමට මත්තෙන් පුහුණුවෙන් ඉවත් වන්නේ නම් එනෙක් ඔහු හෝ ඇය වෙනුවෙන් බස්නාහිර පළාත් සභාව මගින් දැරූ වියදම ආපසු ගෙවීමට බැඳී සිටින අතර, ඒ සඳහා වූ ඇප ගිවිසුමකට එළඹිය යුතුය.

v. පුහුණු කාලය අවසානයේදී පවත්වනු ලබන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වලදී සමත්වන ආධුනිකයන් සඳහා NVQ-Level 04 මට්ටමේ සහතිකයක් නිකුත් කරනු ලබන අතර, පුහුණුවට අදාළ රැකියා ලබා දීමට මෙම දෙපාර්තමේන්තුව හෝ පුහුණු ආයතනය බැඳී නොසිටී.

vi. අයදුම්කරුවන් වෙනත් කිසිදු පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොතිබිය යුතුය.

**පළාත් අධ්‍යක්ෂ(බටහිර),**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,**
**වැලිසර, රාගම.**
**දිනය: 2025. 09. 04**